# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2008/14 – 2017 පෙබරවාරි 28 වැනි අඟහරුවාදා – 2017.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, බතීගම ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/ඩීකේඩබ්ලිව්/2015/519 හා 2015.12.02 දරන ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.9603ක් වන කැබලි අක්ෂර 'ඒ' ලෙස දක්වා ඇති ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වන්නිආරච්චි කංකානම්ගේගෙදරවත්ත, ඉත්තෑබෙනේවත්ත, රතුරාලගෙවත්ත, ඉහලවෙරළුගහවත්ත, දමනියගහවත්ත සහ දියවරකගහකොටුව – ප්‍රමාණය: හෙක්. 0.9603**

උතුරට: ඩබ්ලිව්. ටී. සුරංග නයනජීව හිමිකම් කියන දුම්වැටියවත්ත හෙවත් දංකැටියවත්ත, ඩබ්ලිව්. ඒ. පී. සංජීව ද සිල්වා හිමිකම් කියන දුම්වැටියවත්ත හෙවත් දංකැටියවත්ත, ඩබ්ලිව්. ඒ. කේ. සී. ජයන්ත පද්මසිරි හිමිකම් කියන දුම්වැටියවත්ත හෙවත් දංකැටියවත්ත සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, හිමිකම් කියන අය නොදන්නා මද්දුමගෙදර, එම්. ජී. සෝමවතී හිමිකම් කියන මද්දුමගෙදර සහ එල්. පී. සමන්ත හිමිකම් කියන මද්දුමගෙදර; දකුණට: හිමිකම් කියන අය නොදන්නා මද්දුමගෙදර, එම්. ජී. සෝමවතී හිමිකම් කියන මද්දුමගෙදර, එල්. පී. සමන්ත හිමිකම් කියන මද්දුමගෙදර සහ මාර්ගය; බටහිරට: එස්. එස්. විතාරණගේ හිමිකම් කියන කවනෙගෙදර, යූ. එම්. ශාන්ත හිමිකම් කියන දුම්වැටියවත්ත හෙවත් දංකැටියවත්ත සහ ඩබ්ලිව්. ටී. සුරංග නයනජීව හිමිකම් කියන දුම්වැටියවත්ත හෙවත් දංකැටියවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2015/වීඊ/43.
2016 නොවැම්බර් මස 17 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 534